රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

වාණිජ මුද්‍රණ, සුරක්ෂා මුද්‍රණ, ප්‍රකාශන, ලිපි ද්‍රව්‍ය හා අභ්‍යාස පොත් නිෂ්පාදනය හා අලෙවිකරණ කටයුතුවල නියැලී සිටින ලාභදායී වාණිජ සංවිධානයක් වන රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ පහත සඳහන් තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

MA 2-2 කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා කාණ්ඩයේ

කාර්මික සහකාර (විදුලි) iii ශ්‍රේණිය තනතුර

රැකියා විස්තරය

★ මුද්‍රණ යන්ත්‍ර ආශ්‍රිත සියලුම විදුලි හා ඉලෙක්ට්‍රොනික උපාංග අලුත්වැඩියාව, ගොඩනැගිලි සම්බන්ධ එකලා හා තෙකලා විදුලි පද්ධති අලුත්වැඩියාව, ආරක්ෂක ලාම්පු අනෙකුත් විද්‍යුත් උපකරණ විදුලි මෝටර් එතීමට අදාළ සියලු අලුත්වැඩියාව හා වායු සමීකරණ අලුත්වැඩියාවන් හා විදුලි විසන්ධි වීමකදී විදුලි ජනක යන්ත්‍ර ක්‍රියා කරවීම.

සුදුසුකම් (බාහිර / අභ්‍යන්තර)

★ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද අදාළ ක්ෂේත්‍රය තුළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට (NVQ Level 5) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

★ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්ද

හෝ

★ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද අදාළ ක්ෂේත්‍රය තුළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 4 ට (NVQ Level 4) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

★ අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර (03) පළපුරුද්ද.

MA 2-2 කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා කාණ්ඩයේ

කාර්මික සහකාර (මුද්‍රණ යන්ත්‍ර කාර්මික) iii ශ්‍රේණිය තනතුර

රැකියා විස්තරය

★ මුද්‍රණ යන්ත්‍ර ආශ්‍රිත සියලු යන්ත්‍ර අලුත්වැඩියාව හා සේවා කටයුතු ඉටු කිරීම

★ වෙල්ඩිං වැඩ ලේත් වැඩ හා මිලින් මැෂින් ක්‍රියාකරවීමේ හැකියාව

සුදුසුකම් (බාහිර / අභ්‍යන්තර)

★ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද අදාළ ක්ෂේත්‍රය තුළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

★ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්ද

හෝ

★ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද අදාළ ක්ෂේත්‍රය තුළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 4 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

★ අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර (03) පළපුරුද්ද.

වෙනත්

★ දිගු සේවා මුරවල වැඩ කිරීමේ හැකියාව

★ රාත්‍රී මුරවල වැඩ කිරීමේ හැකියාව

★ ඵලදායිතා සංකල්ප වලට (5S, ISO, Kaizen) අනුකූලව වැඩ කිරීමේ හැකියාව විශේෂ සුදුසුකම් වේ.

වැටුප් පරිමාණය

MA 2-2 - Rs. 30310/- 10 x 300 - 7 x 350 - 4 x 600 - 20 x 710 - 52360/-

වයස් සීමාව

වයස අවුරුදු 18 නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

බඳවා ගැනීමේ ක්‍රමවේදය

ප්‍රායෝගික පරීක්ෂණයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පසු

සේවා කොන්දේසි

මෙය වසර 03 ක පරිවාස කාලයකට යටත් ස්ථිර පත්වීමක් වන අතර, අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ පත්වීම වසර 01 ක පරීක්ෂණ කාලයකට යටත් කරනු ලැබේ.

වැටුපට අමතරව පහත සඳහන් දීමනාද අයත් වේ.

★ ජීවන වියදම් දීමනාව

★ පැමිණීමේ දිරි දීමනා

★ ආහාර දීමනා

අනෙකුත් ප්‍රතිලාභ

★ සේවකයා සහ ඔහුගේ පවුලේ සාමාජිකයින් ආවරණය වන වෛද්‍යාධාර ක්‍රමය

★ වාර්ෂික ප්‍රසාද දීමනාව

★ සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් ප්‍රතිලාභ

★ ඉතිරි කරගත් නිවාඩු වෙනුවෙන් වැටුප් ගෙවීම

අයදුම්පත්‍ර එවිය යුතු ආකාරය

අයදුම්කරුවන් විසින් ලිපිනය, දුරකථන අංකය සහ ඇතීත් නොවන දෙදෙනෙකුගේ විස්තර සමග සම්පූර්ණ කරන ලද අයදුම්පතක් අදාළ අධ්‍යාපන හා වෘත්තීය සහතිකවල ඡායා පිටපත් සහිතව ලියාපදිංචි තැපැල් මගින් 2021.04.19 දිනට පෙර පහත සඳහන් ලිපිනයට එවිය යුතු අතර, රාජ්‍ය දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතනයන්හි සේවය කරන අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

සභාපති,
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව,
පානඋව, පාදුක්ක.